ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය

දර්ශනය හා මනෝවිද්‍යා අධ්‍යයනාංශය

# "ඇබ්බැහිවීම් පිළිබඳ මනෝවිද්‍යාව සහ පුනරුත්ථාපනය" ඩිප්ලෝමා පාඨමාලාව සඳහා අයදුම්පත් කැඳවීම 2020/2021

පාසල් අධ්‍යාපනය අවසන් වූවන්, පොලීසිය, සුරාබදු දෙපාර්තුමේන්තුව, බන්ධනාගාර දෙපාර්තමේන්තුව, පුනරුත්ථාපන අමාත්‍යාංශය, ත්‍රිවිධ හමුදා නිළධාරීන්, පරිවාස හා ළමා රක්ෂණ නිළධාරීන්, මනෝවිද්‍යා උපදේශකවරුන් ඇතුළු මනෝවිද්‍යා ක්ෂේත්‍රයන්හි නියුතු සහ උනන්දුවක් දක්වන අය සඳහා උක්ත පාඨමාලාවට අයදුම්පත් කැඳවනු ලැබේ.

| පාඨමාලා කාලය :අවුරුදු එකයි (01) | අධ්‍යයන මාධ්‍යය :සිංහල | පාඨමාලා ගාස්තුව : රු 45000/= |
|---|---|---|
| (ඉරිදා දින පෙ.ව 08. 00 සිට ප.ව 05. 00 දක්වා) | | (25000 සහ 20000) වාරික 02ක් ලෙස ගෙවිය හැක. |

**<u>පාඨමාලාවේ ප්‍රතිලාභ</u>**

- ❖ පුනරුත්ථාපන සහ උපදේශන සේවාවේ නියුතු නිළධාරීන්ට උසස්වීම් ලබාගැනීම සඳහා.
- ❖ පුනරුත්ථාපන සහ උපදේශන සේවාවේ රැකියා ලබාගැනීම සඳහා අවශ්‍ය ප්‍රධාන සුදුසුකමක් වීම.
- ❖ එම ක්ෂේත්‍රයන් හි රැකියා වල නිරත වූවන්ට අවශ්‍ය සිද්ධාන්ත හා ප්‍රායෝගික දැනුම ලබාගැනීමට හැකිවීම.
- ❖ පුනරුත්ථාපනය හා සම්බන්ධ දේශීය හා විදේශීය පුහුණුව ලබාගතහැකි වීම. (*කොන්දේසි සහිතයි)

**<u>අවශ්‍ය සුදුසුකම්</u>**

- ❖ අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාරගණනකදී සම්මාන තුනක් (03) ඇතුළුව විෂයන් හයකින් සමත් වීම. **හෝ**
- ❖ අ.පො.ස. (උ. පෙළ) ඕනෑම විෂයන් තුනකින් සමත් වීම. **හෝ**
- ❖ පොලිස්, බන්ධනාගාර, පරිවාස, හා ළමා රක්ෂණ, ත්‍රිවිධ හමුදා, නීති, සුරාබදු, අන්තරායකර ඖෂධ පාලක මණ්ඩලයේ උපදේශන සේවා ඇතුළු ක්ෂේත්‍රවල අවම වශයෙන් වසර 03ක පළපුරුද්දක් තිබීම.

**<u>අයදුම්පත් ඉදිරිපත් කිරීමේ ක්‍රියා පටිපාටිය</u>**

අදාළ අයදුම්පත www.sjp.ac.lk වෙබ් අඩවියට පිවිස බාගත (Download) හැක.

අයදුම්පත් ගාස්තුව රු 1500/= ක් වන අතර එය ඕනෑම මහජන බැංකු ශාඛාවකින් ගිණුම් අංක 013010001587 දරණ ගිණුමට ගෙවිය යුතුය. මුදල් තැන්පත් කර අදාළ රිසිට් පත, සම්පූර්ණ කරන ලද අයදුම්පත සමඟ අමුණා පහත සඳහන් ලිපිනයට 2020. 09. 30 දිනට ප්‍රථම යොමුකළ යුතුය.

පාඨමාලා සමායෝජක,

දර්ශනය හා මනෝවිද්‍යා අධ්‍යයනාංශය,

මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය,

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය,

ගංගොඩවිල, නුගේගොඩ.

**විමසීම්**

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය

අරුණ ශාන්ත වල්පොල

දර්ශනය හා මනෝවිද්‍යා අධ්‍යයනාංශය

දු. අංක 0112758348 / 0112802272 / 0712357415

**ලේඛකාධිකාරී - ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**